# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2241/37 - 2021 අගෝස්තු මස 18 වැනි බදාදා - 2021.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 10/2015

**ආගාමික හා විගාමික පනත (351 වන අධිකාරිය)**

(351 වන අධිකාරිය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වන වගන්තිය සමග කියවිය යුතු 52 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක අමාත්‍ය.

2021 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1956 පෙබරවාරි මස 24 වැනි දින අංක 10,896 දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා වූ අතිරේකයේ පළ කරනු ලැබූ 1956 ආගාමික හා විගාමික නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. 8 වන නියෝගයේ

(1) (1) වන ඡේදයේ ''ඡායාරූපයෙන් හෝ ඇඟිලි සටහන්වලින් හෝ ඒ දෙකෙන්ම තමා විසින් නියම කරනු ලබන පිටපත් ගණනක්'' යන වචන වෙනුවට ''ඡායාරූපයෙන් හෝ ජෛවමිතිකවලින් හෝ ඒ දෙකෙන්ම තමා විසින් නියම කරනු ලබන පිටපත් ගණනක්'' යන වචන ආදේශ කිරීමෙන්'',

(2) (2) වන ඡේදයේ, ''හෝ ඇඟිලි සටහන්වල'' යන වචන වෙනුවට ''හෝ ජෛවමිතිකවල'' යන වචන ආදේශ කිරීමෙන්,

2. 10 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

''10අ. (1) ශ්‍රී ලංකාව තුළ අතිවාසය කිරීම මගින් යම් තැනැත්තකුට දෙනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් වීසා පත්‍රයක කොන්දේසියක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වූ නැවතී සිටීමේ කාල සීමාව, උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් අදාළ වීසා පත්‍ර ගාස්තුවට අමතරව අතිවාසය කළ කාල සීමාව සඳහා දඩුවමක් වශයෙන් ඇමරිකානු ඩොලර් 500ක් ගෙවිය යුතුය.

(2) (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද නියමිත බලධරයා විසින් -



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) (1) වන ඡේදයේ සඳහන් තැනැත්තකුට නික්ම යාමේ තොටෙහි දී දින දෙකක; හෝ

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් වීසා පත්‍රයේ නිශ්චිතව සඳහන් නැවතී සිටීමේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී දින හතක,

සහන කාලයක් ලබා දෙනු ලැබිය හැකිය.

3. එහි 13 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''13. (1) වීසා පත්‍ර පිළිබඳව ගෙවිය යුතු ගාස්තු පහත වගුවේ දක්වා ඇති පරිදි විය යුතුය :-

වගුව

| වීසා පත්‍රයේ වර්ගය | | ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ( US $) |
|---|---|---|
| 1 වාස වීසා පත්‍රය | 1. (i) ආයෝජකයන් සඳහා ;<br>(ii) සේවා නියුක්තයන් සඳහා;<br>(iii) ශිෂ්‍යයන් සඳහා;<br>(iv) ශ්‍රී ලංකාවේදී වෛද්‍ය ප්‍රතිකාර අපේක්ෂාවෙන් පැමිණෙන තැනැත්තන් සඳහා;<br>(v) රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරන තැනැත්තන් සඳහා;<br>(vi) ආගමික කටයුතුවල යෙදෙන්නන් සඳහා;<br>(vii) (i), (ii), (iii), (iv), (v) හා (vi) වන අයිතමයන්හි සඳහන් තැනැත්තකුගේ කලත්‍රයා සඳහා;<br>(viii) (i),(ii),(iii), (iv) (v) හා (vi) වන අයිතමයන්හි සඳහන් යම් තැනැත්තකුගේ යැපෙන දරුවන්ගෙන් අයකු සඳහා<br>(එක් එක් දොළොස් මස් කාල සීමාවකට හෝ ඉන් කොටසකට), | 200.00 |
| | 2. (i) (349 වන අධිකාරය වූ) පුරවැසි පනතේ 19, 20 හෝ 21 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අවසන් වූ යම් තැනැත්තකු සඳහා;<br>(ii) (i) වන අයිතමයේ සඳහන් තැනැත්තකුගේ කලත්‍රයා සඳහා;<br>(iii) (i) වන අයිතමයේ සඳහන් තැනැත්තකුගේ යැපෙන දරුවන්ගෙන් අයකු සඳහා<br>(එක් එක් දොළොස් මස් කාලසීමාවකට හෝ ඉන් කොටසකට) | 100.00 |
| | 3. (i) 1967 අංක 14 දරන ඉන්දු - ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ 13 වන වගන්තිය යටතේ ඉන්දියානු පුරවැසියකු ලෙස ලියාපදිංචිය ලත් යම් තැනැත්තකු සඳහා;<br>(ii) (i) වන අයිතමයේ සඳහන් තැනැත්තකුගේ කලත්‍රයා සඳහා;<br>(iii) (i) වන අයිතමයේ සඳහන් තැනැත්තකුගේ යැපෙන දරුවන්ගෙන් අයකු සඳහා<br>(එක් එක් දොළොස් මස් කාලසීමාවකට හෝ ඉන් කොටසකට), | 100.00 |
| | 4. පූජ්‍ය පක්ෂයේ අයකු සඳහා | නිදහස් |

| වීසා පත්‍රයේ වර්ගය | | ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ( US $) | |
|---|---|---|---|
| | 5. (i) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී විවාහය සය මසකට වඩා වැඩි කාලයක් පවතින ශ්‍රී ලාංකික පුරවැසියකුගේ ශ්‍රී ලාංකීය නොවන කලත්‍රයා සඳහා;<br>(ii) (i) වන අයිතමයේ සඳහන් ශ්‍රී ලාංකීය නොවන කලත්‍රයාගේ යැපෙන දරුවන්ගෙන් අයකු සඳහා | නිදහස් | |
| | 6. මියගිය ශ්‍රී ලාංකිකයකුගේ නැවත විවාහ නොවූ ශ්‍රී ලාංකික නොවන කලත්‍රයා සඳහා (සේවා නියුක්තිය සඳහා අවසරය සමඟ) (එක් එක් දොළොස් මස් කාලසීමාවකට හෝ ඉන් කොටසකට), | 100.00 | |
| | 7. ශ්‍රී ලාංකික පුරවැසියකුගේ වසර දහයකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවේ අඛණ්ඩව ජීවත් වන ශ්‍රී ලාංකීය නොවන කලත්‍රයා සඳහා<br>(සේවා නියුක්තිය සඳහා අවසරය සමඟ)<br>(එක් එක් දොළොස් මස් කාලසීමාවකට හෝ ඉන් කොටසකට), | 100.00 | |
| | 8. ශ්‍රී ලාංකික පුරවැසියකුගේ අවුරුදු දහඅටට අඩු දරුවන් සහිත ශ්‍රී ලාංකීය නොවන කලත්‍රයා සඳහා (සේවා නියුක්තය සඳහා අවසරය සමඟ)<br>(එක් එක් දොළොස් මස් කාලසීමාවකට හෝ ඉන් කොටසකට), | 100.00 | |
| 2. පැමිණීමේ වීසා පත්‍රය | සංචාරක කාර්ය | මාර්ගගත | පැමිණි පසු |
| | 1. දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයේ (SAARC) රටවල් සඳහා (දින තිහක් දක්වා) (සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය) (ETA) | 20.00 | 25.00 |
| | 2. දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයට (SAARC) අයත් නොවන වෙනත් රටක් සඳහා, (දින තිහක් දක්වා) (සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය) (ETA) | 35.00 | 40.00 |
| | | මාර්ගගත | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් |
| | 3. පහත සඳහන් නම් කළ රටවල් සඳහා -<br>ඔස්ට්‍රියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, නෙදර්ලන්තය, පෝලන්තය, ඉතාලිය, පින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය, ස්පාඤ්ඤය, ග්‍රීසිය, ස්වීඩනය, හංගේරියාව, එක්සත් රාජධනිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය, ස්විස්ටර්ලන්තය, නෝර්වේ, පෘතුගාලය, ස්ලෝවේනියාව, එස්තෝනියාව, මොරිෂස්, අයිස්ලන්තය සහ කියුබාව<br>(දින තිහකට පසු සහ දින අනූව දක්වා) | 100.00 | 100.00 |

| වීසා පත්‍රයේ වර්ගය | | ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ( US $) | |
|---|---|---|---|
| | 4. ඇමරිකා එක්සත් ජනපදය සඳහා<br>(දින අනූවකට පසු සහ දින එකසිය අසූව දක්වා) | - | නිදහස් |
| | 5. සිංගප්පූරුව, මාලදිවයින, සීෂෙල්ස් සහ චෙක් සමූහාණ්ඩුව සඳහා<br><br>(දින තිහකට පසු සහ දින අනූව දක්වා) | - | නිදහස් |
| | 6. නම් කළ රටක්, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මාලදිවයින, සීෂෙල්ස් සහ චෙක් සමූහාණ්ඩුව හැර වෙනත් යම් රටක් සඳහා,<br><br>(දින තිහකට පසු සහ දින අනූව දක්වා) | - | 60.00 |
| | 7. ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා<br><br>(දින අනූවකට පසු සහ දින එකසිය අසූව දක්වා) | - | 150.00 |
| | 8. ඕනෑම රටක් සඳහා<br><br>(දින එකසිය අසූවකට පසු සහ දින දෙසිය හැත්තෑව දක්වා | - | 200.00 |
| | ව්‍යාපාරික කාර්ය | මාර්ගගත | පැමිණි පසු |
| | 9. දකුණු ආසියා සහයෝගිත සංවිධානය (SAARC) අයත් රටවල් සඳහා<br><br>(දින තිහක් දක්වා)<br><br>(සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය)<br>(ETA) | 30.00 | 40.00 |
| | 10. දකුණු ආසියා සහයෝගිතා සංවිධානයට (SAARC) අයත් නොවන රටක් සඳහා<br><br>(දින තිහක් දක්වා)<br>(සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය)<br>(ETA) | 40.00 | 50.00 |
| | | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් | |
| | 11. ඇමරිකා එක්සත් ජනපදය සඳහා<br>(දිනතිහකට පසු සහ දින එකසිය අසූව දක්වා) | 100.00 | |
| | 12. ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා<br>(දින තිහකට පසු සහ දින අනූව දක්වා) | 100.00 | |
| | 13. ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් යම් රටක් සඳහා<br>දින අනූවකට පසු සහ දින එකසිය අසූව දක්වා | 200.00 | |

| වීසා පත්‍රයේ වර්ගය | | ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ( US $) |
|---|---|---|
| | 14. සියලු රටවල් සඳහා එක් ගමනක් හෝ ගමන් ගණනක් සඳහා (එක් එක් දෙළොස් මස් කාල සීමාවකට හෝ ඉන් කොටසකට) (එක් එක් රැඳී සිටීමේ කාලය මාස හයක් දක්වා සීමිතව | 200.00 |
| 3. මාර්ගස්ථ වීසා පත්‍රය | සියළු රටවල් සඳහා | නිදහස් |

එසේ වුවද -

(අ) තානාපති හෝ නිල විදේශ ගමන් බලපත්‍රයක් දරන්නාවූ ; හෝ
(ආ) තමාගේ විදේශ ගමන් බලපත්‍රයෙහි වලංගු තානාපති හෝ නිල පිටසනක් දරන්නා වූ,

යම් තැනැත්තකුට වීසා පත්‍රයක් දීම හෝ නිකුත් කිරීම සඳහා ගාස්තුවක් නොගෙවිය යුතුය.

(2) (1) වැනි ඡේදයෙහි පටහැනිව කුමක් සඳහන් වුවද, එය නොසලකා -

(අ) (ශ්‍රී ලංකාව නොවන) යම් රටක රටවැසියකු විසින් පැමිණීමේ වීසා පත්‍රයක් හෝ මාර්ගස්ථ වීසා පත්‍රයක් සඳහා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු ඒ රටේ වීසා පත්‍රයක් සඳහා ගෙවීමට බැඳී සිටින මුදලට නොවැඩි මුදලක් ගෙවිය යුතු යයි නියම කළ හැකිය; සහ

(ආ) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් වෙනත් රජයක නියෝජිතයකු විසින් පැමිණීමේ වීසා පත්‍රයක් හෝ මාර්ගස්ථ වීසා පත්‍රයක් යම් තැනැත්තකුට දෙනු ලබන අවස්ථාවක දී, රාජ්‍යයන් දෙක අතර නියම කර ගනු ලබන යම් මුදලක් ඒ වීසා පත්‍රය සඳහා ගෙවීමට ඒ තැනැත්තාට නියම කළ හැකිය.''

4. 15 වන නියෝගයෙහි ''හය මසකට නොවැඩි කාල සීමාවක් සඳහා'', යන වචන වෙනුවට ''මාස නවයකට නොවැඩි කාල සීමාවක් සඳහා එක් ගමනක් හෝ ගමන් ගණනක් සඳහා'' යන වචන ආදේශ කිරීමෙන්.

09-45

---

එල්. ඩී. බී. 10/2015

**ආගාමික හා විගාමික පනත (351 වන අධිකාරිය)**

(351 වන අධිකාරිය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක අමාත්‍ය.

2021 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2019 ජුනි මස 03 වැනි දින අංක 2126/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආගාමික හා විගාමික නියෝග මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

09-45/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.